**ශ්‍රී ලංකා වරාය අධිකාරිය**
**දැන්වීමයි**

මගේ අංකය: මාසකො/විධා/05/08(ii)

පහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති තම තනතුරේ ස්ථිර වූ මෙම අධිකාරියේ සේවකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුර : ජ්‍යෙෂ්ඨ වැඩ අධිකාරී (සිවිල්/ යාන්ත්‍රික/ විදුලි හා විද්‍යුත්)**
**(කණිෂ්ඨ කළමනාකරණ මට්ටම) - JLM**

I. **වැටුප් කාණ්ඩය** : (JLM)
මූලික වැටුප : රු. 75,065/=
වැටුප් වර්ධකය : රු. 1,440/=

II. **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

(අ) අදාල ක්ෂේත්‍රයේ ජාතික තාක්‍ෂණ ඩිප්ලෝමාව (NDT) / උසස් ජාතික තාක්‍ෂණ ඩිප්ලෝමාව (HNDT) / ඉංජිනේරු විද්‍යාව පිළිබද උසස් ඩිප්ලෝමාව (HNDE) / ඉංජිනේරු විද්‍යාව පිළිබද ජාතික ඩිප්ලෝමාව (NDES) / ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු ඩිප්ලෝමාව (ED-OUSL) / ඉංජිනේරු තාක්‍ෂණය පිළිබද ජාතික ඩිප්ලෝමාවක් (NDET) / City & Guildes අවසාන සහතිකය ලබා තිබීම. අදාල ක්ෂේත්‍රයේ විශේෂ ආධුනිකත්ව පුහුණුව සාර්ථකව සම්පූර්ණ කර තිබීම (අවම වශයෙන් වසර හතර (04) ක පාඨමාලා කාලයක් විය යුතුය)

**හෝ**

ක්ෂේත්‍රයට අදාළ පස්වන මට්ටමේ (NVQ 5) ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය හෝ ඒ හා සමාන මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනයෙන් ලබා ගන්නා ලද අදාල ක්ෂේත්‍රයේ නිපුණතා සහතිකයක්

**සමඟ**

**පළපුරුද්ද**
SG වැටුප් කාණ්ඩයේ අදාල ක්ෂේත්‍රයේ වසර පහ (05) ක සක්‍රීය පලපුරුද්ද

**හෝ**

(ආ) අදාල ක්ෂේත්‍රයේ සිව්වන මට්ටමේ ජාතික වෘත්තීය සුදුසුකම් NVQ 4/ මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනයෙන් ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ නිපුණතා සහතිකය/ ජාතික තාක්‍ෂණ සහතිකය (NCT) / ඒ හා සමාන සහතිකයක් ලබා තිබීම.

**සමඟ**

**පළපුරුද්ද**
SG වැටුප් කාණ්ඩයේ අදාල ක්ෂේත්‍රයේ වසර අට (08) ක සක්‍රීය පලපුරුද්ද

III **තෝරා ගැනීමේ විශේෂ නිර්ණායක**
කාර්ය සාධන ඇගයීම සතුටුදායක මට්ටමක තිබිය යුතුයි.

(සුදුසුකම් ලත් අපේක්ෂකයින් අවශ්‍ය වුවහොත් ලිඛිත පරීක්ෂණයකට භාජනය කරනු ලබන අතර, ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය පසුව දැනුම් දෙනු ලැබේ.)

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් සම්පාදනය කර ඇති හෝ මින් ඉදිරියට සම්පාදනය කරනු ලබන හෝ සියළුම නීති රීති වලට අනුකූලව පත්වීම් ලබන්නන් කටයුතු කළ යුතු වේ.

තෝරාගත් අපේක්ෂකයින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍ය වන පරිදි දිවයිනේ ඕනෑම පෙදෙසක හෝ අධිකාරියේ ඕනෑම කොට්ඨාශයක/ අංශයක සේවය කිරීමට බැදී සිටී.

ආදර්ශ ආකෘතිපත්‍ර ප්‍රකාරව සකසන ලද අයදුම්පත් 2024-07-19 වෙනි දින හෝ ඊට පෙර ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන) වෙත ලැබෙන සේ අදාල කොට්ඨාශ/ අංශ ප්‍රධානියා මගින් එවිය යුතු වේ. ඒ සමඟ අධ්‍යාපන හා වෘත්තීය සහතිකවල පිටපත්ද අමුණා එවිය යුතු අතර, අදාළ සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් හා මෙම දැන්වීමේ අවශ්‍යතාවයන්ට සෑම අයුරින්ම අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

නියමිත දිනෙන් පසුව යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රමාදවීමට තුඩුදුන් කරුණු අදාළ කොට්ඨාශ ප්‍රධානීන් විසින් හෝ සඳහන් කළයුතු අතර, එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන)**

2024-06-24 වෙනි දින.
මානව සම්පත් කොට්ඨාශයේදීය.